ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2026.10.12

වෛද්‍ය එම්.එස්.ආර්. විජේතුංග මයා,
330/4, මීගමු පාර,
කුරුණෑගල.
පැමිණිලිකරු

එදිරිව

පැමිණිලි අංකය : එච්ආර්සී/329/26

සභාපති,
ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය,
අංක 170, හයිලෙවල් පාර,
නුගේගොඩ.
වගඋත්තරකරු

<u>පැමිණිල්ලේ සඳහන් කරුණු:</u>

ඉහත නම් සඳහන් පැමිණිලිකරු විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ගොනු කරමින් දන්වා ඇත්තේ ඉහත වගඋත්තරකාර ආයතනයේ 2009 සිට 2019 වර්ෂය දක්වා කොන්ත්‍රාත් පදනමින් සේවය කළ අතර සෞඛ්‍ය හේතුන් මත සේවයෙන් ඉවත් වීමෙන් පසුව 2020 වර්ෂයේ දෛනික පැය පදනම මත නැවත සේවයට බැදුනු බවත් ඉන් අනතුරුව 2020.12.01 දින සිට 2022.10.31 දින දක්වා එනම් ආයතනය විසින් සේවය අවසන් කිරීමේ ලිපිය නිකුත් කරන ලද දින වකවානුව දක්වා සේවය කළ බවත් ය.

එකී ආයතනය තුළ සිදු වූ අකටයුතුකම් සම්බන්ධව සභාපතිතුමාට සහ අල්ලස් කොමිෂන් සභාවට පැමිණිලි කිරීම සම්බන්ධව මෙම පැමිණිලිකරු සමග ඇති වූ අමනාපය හේතු කොට ගෙන 2022 වර්ෂයේ සැප්තැම්බර් මස 09 වන දින එම ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් කොන්ත්‍රාත් පදනම මත අවුරුදු 70 දක්වා වෛද්‍ය නිලධාරීන් දීර්ඝ කිරීමට අවුරුදු 70 ට වැඩි කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සියලුම වෛද්‍ය නිලධාරීන්ගේ සේවය 2022 වර්ෂයේ ඔක්තෝබර් 31 දිනෙන් අවසන් කිරීමට තීරණයක් ගන්නා ලද බවට වැඩිදුරටත් දන්වා ඇත.

එකී තීරණය අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය ගැනීමට පෙර ආයතන තුළ ගෙන ඇති තීරණයක් බවත් එවැනි තීරණයක් ලබා ගෙන ඇත්තේ පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීමේ චේතනාවෙන් බවත් ආයතනය තුළ ලබා ගන්නා ලද එම තීරණය සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවය විසින් දැනුම් දීමක් සිදු කර නොමැති බවත් තවදුරටත් සඳහන් කර ඇත.

පැමිණිලිකරු විසින් 2020 වර්ෂයේ නැවත ඉහත වගඋත්තරකාර ආයතනයේ සේවය කිරීම සඳහා වෛද්‍ය නිලධාරී තනතුරට පත් කිරීමට අදාළව ලබාදුන් පත්වීම් ලිපියේ පිටපතක් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ 2022 වර්ෂය සඳහා දින දීර්ඝ කිරීම පිළිබදව පත්වීම් ලිපියක් නිකුත් කර

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04. / இல. 14, ஆர். ஏ. த. மெல் மாவத்தை, கொழும்பு 04. / No. 14, R. A. De Mel Mawatha, Colombo 04.
සභාපති / தவிசாளர் / Chairman: 011 - 250 5451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 250 5541/74
ඊමේල් / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
දුරකථනය / தொலைபேசி / Telephone: 94-11-2505580 / 81 / 82
ලේකම් / செயலாளர் / Secretary: 011 - 250 5521
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

නොමැති බවත් 2021.12.30 දිනැති වගඋත්තරකාර ආයතනයේ සභාපති විසින් අත්සන් කරන ලද පැමිණිලිකරුගේ නම ඇතුළත් වෛද්‍ය නිලධාරීන් 44 දෙනෙකුගේ නම් ඇතුළත් කර ලිපියක් නිකුත් කර ඇති බවත් එකී ලිපිය අනුව කොන්ත්‍රාත් පදනම මත වෛද්‍ය නිලධාරී වශයෙන් සේවය කරනු ලබන වෛද්‍ය නිලධාරීන්ගේ සේවා කාලය අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන තුරු 2022 වර්ෂය සඳහා දීර්ඝ කර ඇති බවට දැනුම් දී ඇති බවත් ය.

පැමිණිලිකරු විසින් වැඩිදුරටත් සඳහන් කර ඇත්තේ අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණයේ අවුරුදු 70 වැඩි වෛද්‍ය නිලධාරීන් සම්බන්ධව වහාම කටයුතු කරන ලෙසට කිසිදු අවස්ථාවක අදාළ ආයතනය වෙත උපදෙස් ලබා දී නොමැති නමුත් වගඋත්තරකාර ආයතනය විසින් එහි සඳහන් කරුණු නිසි පරිදි සලකා නොබලා 70 ට වැඩි නිලධාරීන් සියලු දෙනා ඉවත් කිරීමට කඩිනමින් පියවර ගැනීම තුළින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවයි.

ඒ අනුව පැමිණිලිකරුගේ උපරිම වයස් සීමාව අවුරුදු 75 දක්වා සේවය කිරීමට හැකියාව තිබූ නමුත් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයෙන් අසාධාරණයට ලක් වී ඇති බවත් එ අනුව අවුරුදු 73 න් සේවයෙන් ඉවත් වීමට සිදුවීම හේතුවෙන් නැවත රැකියාව ලබා ගැනීමට සහ 2022.10.31 දින සිට සේවයේ පිහිටුවා මේ දක්වා හිග වැටුප් ලබා ගැනීමට මෙම කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කර ඇති බවයි.

මේ පිළිබඳව කම්කරු දෙපාර්තමේන්තුව වෙතද පැමිණිල්ලක් ගොනු කරමින් නැවත සේවයේ පිහිටුවීම සම්බන්ධව සහනයක් ඉල්ලා සිටි අතර එහිදී ආයතනය තුළ සේවක සේවිකාවන් දෙපාර්ශවයට කාර්මික සාමය පවත්වාගෙන යාමට හැකිවන පරිදි 2021.12.31 දක්වා පැමිණිලිකරුගේ සේවය යොදවා ගතහැකිව තිබූ බවට නිරීක්ෂණය කර ඇති අතර පැමිණිලිකරුවන් විසින් 2022.12.31 දක්වා දීර්ඝ කිරීමක් හෝ එම කාලයට අදාළ පාරිතෝෂික ගෙවීම සුදුසු බවට නිර්දේශ කර ඇති නමුත් මේ පිළිබඳ අදාළ වගඋත්තරකාර ආයතනය විසින් කිසිදු පියවරක් ගෙන නොමැති බවට මෙම කොමිෂන් සභාව වෙත ඉහත පැමිණිල්ල මගින් වැඩිදුරටත් කරුණු ඉදිරිපත් කර ඇත.

<u>වගඋත්තරකරුගේ කරුණු දැක්වීම්:</u>

මෙම පැමිණිල්ල සම්බන්ධව වගඋත්තරකාර පාර්ශවය විසින් මෙම කොමිෂන් සභාව වෙත දන්වා තිබෙන්නේ, 2022.09.06 දින අමාත්‍ය මණ්ඩලය විසින් තීරණයක් ගැනීමෙන් පසුව එකී තීරණයට අනුව 2022.09.09 දින වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණයක් ගෙන ඒ අනුව අවුරුදු 70 ට වැඩි වෛද්‍ය නිලධාරීන්ගේ සේවය අවසන් කිරීමේ ලිපිය නිකුත් කර ඇති බවත් ය. ඒ අනුව එකී වෛද්‍ය නිලධාරීන්ගේ සේවය අවසන් කිරීමේ ලිපිය නිකුත් කර ඇත්තේ 2022.09.26 දිනැති ලිපිය මගින් බවත් එසේම පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් සේවා කාලය ද 2022.10.31 දින සිට අවසන් වන බවට ඉහත කී සේවය අවසන් කිරීමේ ලිපිය මගින් දැනුම්දීමක් සිදු කිරීමෙන් අනතුරුව 2022.10.31 දිනෙන් මෙම පැමිණිලිකරුගේ සේවය ද අවසන් කර ඇති බවට වැඩිදුරටත් දන්වා ඇත.

තවද වගඋත්තරකාර පාර්ශවය විසින් සඳහන් කර ඇත්තේ අමාත්‍ය මණ්ඩල සංදේශයේ යෝජනා කර තිබෙන්නේ වගඋත්තරකාර ආයතනයේ පවතින වෛද්‍ය නිලධාරීන්ගේ හිගය මග හරවා ගැනීම සඳහා සේවා අවශ්‍යතාවය පරිදි වයස අවුරුදු 65 සිට 75 දක්වා වයස් කාණ්ඩ වල වෛද්‍යවරුන් කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීමට සුදුසු බවට යෝජනා කරමින් එකී සංදේශය ඉදිරිපත් කර තිබූ නමුත් අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය අවුරුදු 70 දක්වා වෛද්‍යවරුන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවීමට අනුමැතිය ලබා දී ඇති බවත් ය.

පැමිණිලිකරු සමග 2022.10.31 දිනෙන් සේවය අවසන් කරන ලද තවත් නිලධාරියෙකු විසින් කම්කරු දෙපාර්තමේන්තුවේ යොමු කරන ලද සේවය අවසන් කිරීමට අදාළ පෙත්සම පිළිබඳ ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කම්කරු විනිශ්වාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කර ඇති

බවත් එම අභියාචනය ප්‍රතික්ෂේප වීමෙන් අනතුරුව ඒ පිළිබඳව මහාධිකරණය වෙත ප්‍රතිශෝධනයක් ඉදිරිපත් කර ඇති බවත් එකී ප්‍රතිශෝධනය ද නිශ්ප්‍රභා කර ඇති බවත් අදාළ නඩු වාර්තා වල පිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර සිටී.

තවද, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය 1997 අංක 25 දරණ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනත මගින් ස්ථාපිත කර ඇති අතර ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යවස්ථාපිත ආයතනයක් බවත් එම ආයතනයේ මූලික කාර්ය වන්නේ රියදුරු බලපත්‍ර අපේක්ෂකයින් සඳහා වෛද්‍ය සහතික නිකුත් කිරීම වන බවත් එම කාර්ය ඉටු කිරීම සඳහා ස්ථිර, කොන්ත්‍රාත් සහ දෛනික පැය පදනම මත වෛද්‍ය නිලධාරීන් සේවයේ යෙදී සිටින බවත් ය.

මෙම පැමිණිල්ල ඉදිරිපත් කර ඇති වෛද්‍ය එම්.එස්.ආර්. විජේතුංග මහතා 2009.02.01 දින සිට 2019.06.01 දක්වා වසර 10 ක් ද ඉන් පසුව 2020.03.12 සිට දෛනික පදනම මත හා 2020.12.01 දින සිට 2022.10.31 දක්වා කොන්ත්‍රාත් පදනම මත වයස අවුරුදු 70 දක්වා සේවය කර ඇති බවත් පැමිණිලිකරුට හිමි සියළුම ව්‍යවස්ථාපිත ගෙවීම් මේ වනවිට ගෙවා අවසන් කර ඇති බවත් පැමිණිලිකරුගේ වයස අවුරුදු 74 ක් බවත් සඳහන් කර ඇත.

කෙසේ වෙතත් එම ගෙවා ඇති වැටුප් හා දීමනා සම්බන්ධයෙන් ඔහු විසින් දිගින් දිගටම විවිධ ආයතන පැමිණිලි කර ඇති අතර කම්කරු දෙපාර්තමේන්තුව වෙත සිදු කරන ලද පැමිණිල්ලට අදාව එය බේරුම්කරණය සඳහා යොමු කර කම්කරු අධිකරණයේ නඩු අංක A/67/2025 යටතේ මේ වන විට විභාග වෙමින් පවතින බවත් වැඩිදුරටත් සඳහන් කර ඇත.

එසේම 2022.09.06 දිනැතිව යොමු කරන ලද වයස අවුරුදු 65-70 දක්වා වන වෛද්‍ය නිලධාරීන්ගේ කොන්ත්‍රාත් පදනම මත ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවයේ යොදවා ගැනීම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවට අනුව ලබා දී ඇති තීරණය පරිදි විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේදී ඔවුන්ගේ කායික හා මානසික යෝග්‍යතාවය තහවුරු කර ගැනීමට යටත්ව වසර දෙකෙන් දෙකට කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ පදනම මත වයස අවුරුදු 70 දක්වා වන විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලය තුළ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවයේ යොදවා ගැනීම පිණිස පමණක් අනුමැතිය ලබා දී ඇති බවත් ඒ අනුව නැවත රැකියාව ලබා දීම 2022.10.31 දින සිට සේවයේ පිහිටුවා හිඟ වැටුප් ලබා දීම සිදුකළ නොහැකි බවට දන්වා ඇත.

<u>කොමිෂන් සභාවේ නිරීක්ෂණ :</u>

මෙම පැමිණිල්ලේ පැමිණිලිකරු ඉහත කී වගඋත්තරකාර ආයතනයේ 2009.02.01 දින සිට 2019.06.01 දක්වා වසර 10 ක කාලයක් කොන්ත්‍රාත් පදනම මත සේවය කර එම ආයතනයේ 2020.03.12 දින සිට දෛනික පදනම මත නැවත සේවයට බැදී 2020.12.01 දින සිට වගඋත්තරකාර පාර්ශවය විසින් සේවය අවසන් කළ දිනය වූ 2022.10.31 දක්වා කොන්ත්‍රාත් පදනම මත සේවය කර ඇති බවට පැහැදිලි වේ.

වගඋත්තරකාර පාර්ශවය විසින් 2022.10.31 දිනෙන් මෙම පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීමට හේතුව ලෙස ඉදිරිපත් කර ඇත්තේ 2022.09.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව බවයි.

ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය ගැනීමට අදාළ වූ අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කරුණු සළකා බැලීමේදී වගඋත්තරකාර ආයතනය විසින් වයස අවුරුදු 65 සිට 75 දක්වා වන වෛද්‍ය නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත සේවයේ යොදවා ගැනීම යන ශීර්ෂය යටතේ ඉදිරිපත් කර ඇති සාධාරණීකරණය අනුව 2022 වාර්ෂික අයවැය ප්‍රකාශනය අනුව රාජ්‍ය සේවයේ විශ්‍රාමික වයස අවුරුදු 65 දක්වා දීර්ඝ කිරීම මත වගඋත්තරකාර ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවය කරනු ලබන වෛද්‍යවරුන්ගේ වයස් සීමාව අවුරුදු 65 සිට 75 දක්වා දීර්ඝ කිරීම මගින් ජාතික ප්‍රවාහන වෛද්‍ය

ආයතනයේ පවතින වෛද්‍යවරුන්ගේ හිඟය මගහරවා ගැනීම හා වඩාත් යහපත් මහජන සේවයක් ඉටු කිරීම සඳහා සේවයේ අවශ්‍යතාවය පරිදි වයස අවුරුදු 65 සිට 75 දක්වා වයස් කාණ්ඩයේ වන වෛද්‍යවරුන් කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවා ගැනීම සුදුසු බවට යෝජනා කර ඇති බවට නිරීක්ෂණය වේ.

ඉහත කී අමාත්‍ය මණ්ඩල සංදේශය සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය කෙරෙහි මෙම කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී. එහිදී පහත පරිදි දක්වා ඇත.

> "විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේදී, ඔවුන්ගේ කායික හා මානසික යෝග්‍යතාව තහවුරු කර ගැනීමට යටත්ව, වසර දෙකෙන් දෙකට කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමේ පදනම මත වයස අවුරුදු 70 දක්වා වන විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන් අනුමත කාර්ය මණ්ඩලය තුළ ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ සේවයේ යොදවා ගැනීම පිණිස අනුමැතිය ලබා දීම සහ ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඒ අනුව කඩිනම් පියවර ගන්නා ලෙස ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ට නියම කිරීම"

යනුවෙන් සඳහන් කර ඇත.

ඒ අනුව පැහැදිලි වන්නේ, **විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන් බඳවා ගැනීමේ** දී වගඋත්තරකාර පාර්ශවය කටයුතු කළයුතු ආකාරය සඳහන් කර ඇති බවටය. එයින්, එම අවස්ථාවේදී ආයතනයේ සිටින විශ්‍රාමික නිලධාරීන් සම්බන්ධව කටයුතු කළයුතු ආකාරයක් සඳහන් කර නොමැති අතර විශ්‍රාමික වෛද්‍යවරුන්ගේ කොන්ත්‍රාත් කාලය 75 දක්වා දීර්ඝ කිරීමක් සිදු කිරීමට අදාළ තීරණයක් ද ගෙන නොමැති බවට නිරීක්ෂණය වේ.

තවද, විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන් නැවත සේවයට **බඳවා ගැනීම** සහ දැනට ආයතනයේ සේවය කරමින් සිටින විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන්ගේ **කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීම** යනු එකිනෙකට පරස්පර වේ.

එසේ තිබියදී, ඉහත වගඋත්තරකාර පාර්ශවය විසින් ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය ලබා දෙන විට එම ආයතනයේ සිටි වයස අවුරුදු 70 ට වඩා වැඩි විශ්‍රාමික වෛද්‍ය නිලධාරීන් වෙත 2022.09.26 දිනැති ලිපිය මගින් 2022.10.31 දිනෙන් සේවය අවසන් කර තිබීම ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් නොවූ කරුණක් සම්බන්ධව කටයුතු කිරීමක් බවට වඩා පැහැදිලිය.

තවද, මෙම පැමිණිලිකරුගේ සේවය 2022 වර්ෂය දක්වා දීර්ඝ කිරීම සම්බන්ධයෙන් පැමිණිලිකරු විසින් ඉදිරිපත් කර ඇති 2021.12.30 දිනැති ලිපිය කෙරෙහි මෙම කොමිෂන් සභාවේ අවධානය යොමු කරන ලදී.

එකී ලිපියේ ශීර්ෂයේ සඳහන් කර ඇත්තේ

> "කොන්ත්‍රාත් පදනම මත වෛද්‍ය නිලධාරී තනතුරේ සේවා කාලය දීර්ඝ කිරීම" යනුවෙන් වේ.

එම ලිපියේ පැමිණිලිකරු ඇතුළු වෛද්‍ය නිලධාරීන් 44 දෙනෙකුගේ නම් තිබෙන අතර, එහි සඳහන් කර තිබෙන්නේ "කොන්ත්‍රාත් පදනම මත වෛද්‍ය නිලධාරී වශයෙන් දැනට මෙම ආයෙතනයට අනුබද්ධව සේවය කරන වෛද්‍ය නිලධාරීන්ගේ සේවා කාලය අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන තුරු 2022 වර්ෂය සඳහා දීර්ඝ කර ඇති බව දන්වමි" යනුවෙන් වේ.

මෙහිදී, "2022 වර්ෂය සඳහා" යනුවෙන් පමණක් සඳහන් කිරීමෙන් පැහැදිලි වන්නේ එම වර්ෂය පුරා සේවය කළහැකි බවට වේ. ඒ අනුව පැමිණිලිකරු හට 2022 වර්ෂයේ දෙසැම්බර් මස දක්වා සේවය

කිරීමට නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇතිවී තිබුණු බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව වගඋත්තරකාර පාර්ශවය විසින් නිසි පරිදි ක්‍රියාත්මක වූයේ නම් 2023 වර්ෂය සඳහා විශ්‍රාමික නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කිරීමේදී හෝ කොන්ත්‍රාත් දීර්ඝ කිරීමේදී ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය පාදක කරගෙන වගඋත්තරකාර ආයතනයේ අවශ්‍යතාවය අනුව ක්‍රියාකළහැකිව තිබුණ ද, ඉහත සඳහන් පරිදි, 2022 වර්ෂයේ ඔක්තෝබර් 31 දිනෙන් මෙම පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීම සඳහා නීත්‍යානුකූල හේතුවක් ඉදිරිපත් කර නොමැත.

ඒ අනුව 2022 වර්ෂය සඳහා දීර්ඝ කරන බවට දැනුම් දීමෙන් එම වර්ෂය පුරා සේවය කිරීමට පැමිණිලිකරුට නීත්‍යානුකූල අපේක්ෂාවක් ලබා දී, 2022 වර්ෂයේ සැප්තැම්බර් මාසයේ අමාත්‍ය මණ්ඩල තීරණ ලද වහාම එකී අමාත්‍ය මණ්ඩල තීරණයේ සඳහන් නොවන කරුණක්, එනම් එම අවස්ථාවේදී ආයතනය තුළ සේවය කරන අවුරුදු 70 ට වඩා වැඩි විශ්‍රාමික නිලධාරීන් සේවයෙන් ඉවත් කිරීමට වගඋත්තරකාර පාර්ශවය විසින් කටයුතු කිරීම තුළින් පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වී ඇති බවට මෙම කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කර සිටී.

1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව පහත පරිදි වේ.

> " නීතිය පසිඳලීම සහ ක්‍රියාත්මක කිරීම ද, නීතියේ රැකවරණය ද, සර්ව සාධාරණ විය යුත්තේ ය."

තවද *Ariyawansa and Others v. The People's Bank and Others (2006) 2 Sri LR 145* යන නඩු තීන්දුවේ

> "*.........any action or law which is arbitrary or unreasonable violates equality.*"

යනුවෙන් දක්වා තිබීම තුළින් අත්තනෝමතික හෝ අසාධාරණ ක්‍රියාවලියන් සමානාත්මතාවය උල්ලංඝණය කිරීමක් බවට නිගමනය කළ හැකි ය.

Edirachcharige Kushan and Others v. Sri Lanka Bureau of Foreign Employment and Others(SCFR/66/2019) යන නඩු තීන්දුවේ

> "*Considering the framework of Article 12(1) of the Constitution, which guarantees the right to equality, and the applicability of the principle of legitimate expectation, it is clear that such an expectation must be founded upon a promise, representation, or commitment made by the relevant authority. Where such a promise or representation exists, the subsequent denial of the opportunity so represented may be regarded as inconsistent with the legitimate expectation thereby created and, depending on the circumstances, unreasonable or contrary to the principles of proper administrative conduct.*"

යනුවෙන් දක්වා ඇත.

මෙහිදී, පැමිණිලිකරුගේ කොන්ත්‍රාත් කාලය 2022 වර්ෂය සඳහා දීර්ඝ කරන බවට වගඋත්තර පාර්ශවය විසින් 2021.12.30 දිනැති ලිපිය දැනුම් දීමෙන් ඉහත නඩු තීන්දුවේ සඳහන් පරිදි අදාළ

බලධාරියා විසින් කරන ලද පොරොන්දුවක් බවට පෙනී යන අතර එමගින් ඇති කරනු ලැබූ නීත්‍යානුකූල අපේක්ෂාවට අනුව ලබා දෙනු ඇතැයි අපේක්ෂා කළ අවස්ථාව පසුව ප්‍රතික්ෂේප කිරීම එම අපේක්ෂාවට පටහැනි වීමක් මෙන්ම අසාධාරණ ක්‍රියාවක් හෝ නිසි පරිපාලන හැසිරීමේ මූලධර්මවලට පටහැනි ක්‍රියාවක් ලෙස සැලකිය හැකි බවට නිරීක්ෂනය වේ.

මෙහිදී වගඋත්තරකාර ආයතනයේ ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය ලැබෙන අවස්ථාවේදී කොන්ත්‍රාත් පදනම මත සේවය කරන ලද විශ්‍රාමික වෛද්‍යවරුන්ගේ කොන්ත්‍රාත් කාලය 2023 වර්ෂය සඳහා දීර්ඝ කිරීමක් සිදු කරන්නේද යන්න තීරණය කිරීමට වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලයට බලය පවතින බවට කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන බැවින් එම වර්ෂය සඳහා කොන්ත්‍රාත් කාලය දීර්ඝ නොකිරීම සම්බන්ධව මෙහිදි සළකා බලනු නොලැබේ.

මෙම ගැටළුව සම්බන්ධව කම්කරු දෙපාර්තමේන්තුව වෙත, සේවය අවසන් කිරීමෙන් අගතියට පත්වූ තවත් පාර්ශවයින් විසින් සිදු කරන ලද පැමිණිල්ලකට අදාළව 2022.11.21 දිනැති ලිපිය මගින් එවකට සිටි කම්කරු කොමසාරිස් විසින් ඉහත වගඋත්තරකාර පාර්ශවය වෙත පහත පරිදි දන්වා ඇත.

> " ඉහත ආරවුලට අදාළ වෛද්‍යවරුන්ගේ අපේක්ෂිත සේවා සැපයීමේ කාලය 2022.12.31 දිනට යෙදී ඇතත් කැබිනට් තීරණයක් පදනම් කර ගනිමින් ඔවුන්ගේ සේවා කාලය 2022.10.31 දිනෙන් අවසන් කිරීම හේතුවෙන් මෙම ආරවුල හටගෙන තිබේ.
>
> එසේම වසර කිහිපයක් පුරාවටම මෙම වෛද්‍යවරුගේ අපේක්ෂිත සේවා කාලය වී ඇත්තේ එම වසරේ ජනවාරි සිට දෙසැම්බර් අවසානය දක්වා බව ඔවුන්ගේ කොන්ත්‍රාත් ගිවිසුම අනුව පැහැදිලි වේ. එබැවින් එය 2022 වර්ෂය සඳහා ද වලංගු විය යුතුය. තවද අංක අමප/22/1215/608/016 දරණ 2022.09.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMT/01/Adm/10-CP-NTMI හා 2022.09.20 දිනැති ලිපියේ සඳහන්ව ඇති පරිදි අවුරුදු 70 ට වැඩි වෛද්‍යවරුන්ගේ සේවය කඩිනමින් අවසන් කළ යුතු බවට දන්වා ඇතත් නිශ්චිත දිනයක් දක්වා නොමැත.
>
> ඒ අනුව ආයතනය තුළ සේවා සේවක දෙපාර්ශවය අතර කාර්මික සාමය පවත්වා ගැනීමට බාධාවක් නොවන පරිදි 2022.12.31 දක්වා ඉහත පැමිණිලිකරුවන් සේවයේ යොදවාගත හැකිව තිබූ බව නිරීක්ෂණය වන බැවින්, මෙම පැමිණිලිකරුවන්ගේ සේවය 2022.12.31 දක්වා දීර්ඝ කිරීම හෝ එම කාලයට අදාළ පාරිශ්‍රමික ගෙවීම සුදුසු බවයි. "

මෙහිදි කම්කරු කොමසාරිස්වරයා විසින් සභාපති, ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය වෙත යොමු කර ඇති ලිපිය මගින්, අමාත්‍යාංශ ලේකම්ගේ අංක SMT/01/Adm/10-CP-NTMI හා 2022.09.20 ලිපියට අනුව අවුරුදු 70 ට වැඩි වෛද්‍යවරුන්ගේ සේවය කඩිනමින් අවසන් කළ යුතු බව දන්වා ඇතත් නිශ්චිත දිනයක් දක්වා නොමැත යනුවෙන් සඳහන් කළද, අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ලිපියේ **" අවුරුදු 70 ට වැඩි වෛද්‍යවරුන්ගේ සේවය කඩිනමින් අවසන් කළ යුතු"** බවක් සඳහන් නොවේ. එය නිවැරදි විය යුතුව පවතින බවද පෙනේ.

මෙහිදී ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අවුරුදු 70 ට වඩා වැඩි විශ්‍රාමික වෛද්‍යවරුන් බඳවා ගැනීමට හැකියාවක් නොමැති බැවින් පැමිණිල්ලේ ඉල්ලා ඇති පරිදි නැවත සේවය පිහිටුවීමට අදාළව සහනයක් මෙම කොමිෂන් සභාව විසින් ලබාදීමට නොහැකි ව පවතී.

නිගමනය :

ඉහත කම්කරු දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කර ඇති පරිදි 2022 වර්ෂය පුරා වගඋත්තරකාර ආයතනයේ සේවය කිරීමට නීත්‍යානුකූල අපේක්ෂාවක් ඇති කිරීමෙන් අනතුරුව 2022 සැප්තැම්බර්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මස 06 දිනැති ඉහත කී අමාත්‍ය මණ්ඩල තීරණය පාදක කරගෙන 2022.10.31 දිනෙන් පැමිණිලිකරුගේ සේවය අවසන් කිරීම 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12 (1) ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් බවට නිගමනය කර සිටී.

නිර්දේශය:

01 අමාත්‍ය මණ්ඩල තීරණය වී ඇත්තේ "<u>බඳවාගැනීමේදී (නව)</u> වසර 70 ඉක්මවූ තැනැත්තන් බඳවා නොගතයුතු බව විනා දැනට බඳවා ගෙන සේවයේ සිටින පිරිසට අවුරුදු 70 ඉක්මවීම සේවය අහිමි කිරීමක් නොවන බවද නිරීක්ෂනය වේ. කෙසේ වෙතත් ඉහත වගඋත්තරකාර ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන්නේ නම් ආයතනයේ අවශ්‍යතාවය අනුව පැමිණිලිකරුට නැවත සේවය ලබාදීමට කටයුතු කිරීම සුදුසු ය.

02 2022.10.31 දින සිට එනම් පැමිණිලිකරුගේ සේවය අවසන් කරන ලද දින සිට 2022.12.31 දක්වා පැමිණිලිකරුට සේවයට හිමිකමක් ඇති බැවින් ඔහු වෙත මාස දෙකකට අදාළ එනම් 2022 වර්ෂයේ නොවැම්බර් සහ දෙසැම්බර් යන මාසයන් සඳහා පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

2026. 11 . 18 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින් ද කොමිෂන් සභාවට දැනුම් දියයුතු වන අතර එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සළකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී. පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත : ලේකම්,
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
7වන මහළ, සෙත්සිරිපාය අදියර II,
බත්තරමුල්ල